ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව උපාධි වැඩසටහන 2020/2021

5 වන මට්ටම

අවසාන පරීක්ෂණය - 2021

SNU5540/ ESU3240 - තුලනාත්මක අධ්‍යාපනය හා අධ්‍යාපන ගැටලු

කාලය පැය තුනයි. (03)

---

දිනය - 2021.08.07 වේලාව - ප.ව.01.30 - ප.ව.04.30 දක්වා

---

1 වන කොටසේ සියලුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.

## 1 වන කොටස

01. තුලනාත්මක අධ්‍යාපනය යන සංකල්පය නිර්වචනය කරන්න.

02. විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය පිළිබඳ ගුරුවරයකු ලෙස තුලනාත්මක අධ්‍යාපනය හැදෑරීමේ ප්‍රයෝජන පහක් (05) දක්වන්න.

03. බහු-වාර්ගික අධ්‍යාපනය සම්බන්ධ ගැටලු විසඳා ගැනීම සඳහා යොදාගත හැකි ක්‍රම තුනක් (03) විස්තර කරන්න.

04. රටක ජාතික මට්ටමේ භාෂා ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීමෙන් ඉටුවෙන කාර්යයන් පහක් (05) සඳහන් කරන්න.

05. 1902 දී ද්විතීය අධ්‍යාපන පනත (බැල්ෆර් පනත) නීතිගත කිරීමෙන් සිදුවූ සුවිශේෂී කාර්යයන් දෙකක් (02) පැහැදිලි කරන්න.

06. ජපානයේ මෙයිජි පාලන සමයේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණවල කැපී පෙනෙන ලක්ෂණ පහක් (05) සඳහන් කරන්න.

07. 1961 ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කරන ලද වැදගත් නිර්දේශ පහක් (05) සඳහන් කරන්න.

08. ඔබ ගුරුවරයකු ලෙස ශිෂ්‍යයන් තුළ වර්ධනය කළයුතු නිපුණතා හත (07) ලයිස්තු ගත කරන්න.

(ලකුණු 5 x 8 = 40)

## 2 වන කොටස

09. (i) 1947 දී ජපානයේ අධ්‍යාපනය සඳහා මූලික නීතියෙහි (The Basic Law on Education) දක්නට ලැබුණු ප්‍රධාන මූලධර්ම හතරක් (04) සඳහන් කරන්න. (ලකුණු 04)

(ii) ශ්‍රී ලංකාවේ ප්‍රාථමික අධ්‍යාපනය සංවර්ධනය කිරීම සඳහා ජපානයේ ප්‍රාථමික අධ්‍යාපනයෙන් ලබාගත හැකි ආදර්ශ හතරක් (04) විස්තර කරන්න. (ලකුණු 08)

(iii) ජපානයේ උසස් අධ්‍යාපනය තුළ දක්නට ලැබෙන ප්‍රබලතා හතරක් (04) නම් කොට එයින් ප්‍රබලතා දෙකක් (02) පැහැදිලි කරන්න. (ලකුණු 08)

10. (i) අධ්‍යාපනයෙහි 'අභ්‍යන්තර කාර්යක්ෂමතාව' සඳහා බලපාන කරුණු හතරක් (04) නම් කරන්න. (ලකුණු 04)

(ii) සංවර්ධනය වෙමින් පවතින රටක් ලෙස ශ්‍රී ලංකාවේ ද්විතීයික අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ දක්නට ලැබෙන ගැටලු හතරක් (04) පැහැදිලි කරන්න. (ලකුණු 08)

(iii) ඔබ ඉහත සඳහන් කළ ගැටලු විසඳීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග හතරක් (04) යෝජනා කරන්න. (ලකුණු 08)

11. (i) "ගෝලීයකරණ සංකල්පය" කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii) විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ගේ අධ්‍යාපනය ඉහළ නැංවීමට ගෝලීයකරණයේ ධනාත්මක ලක්ෂණ උපයෝගී කරගත හැකි ආකාරය උදාහරණ හතරක් (04) ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 08)

(iii) "ගෝලීයකරණයේ ඇතැම් තත්ත්වයන් හේතුවෙන් ශිෂ්‍ය සදාචාරය පිරිහී යා හැකි ය." එවැනි අවස්ථා හතරක් (04) උදාහරණ සහිතව දක්වා ඒවා විසඳීමට අනුගමනය කළ හැකි උපාය මාර්ග හතරක් (04) යෝජනා කරන්න. (ලකුණු 08)

12. (i) පැරණි ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ව්‍යුහයේ ප්‍රධාන ස්ථර තුන (03) උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 06)

(ii) ශ්‍රී ලංකාවේ ස්වදේශීය අධ්‍යාපන ක්‍රමය තුළ පැවති විශේෂ ලක්ෂණ තුනක් (03) විස්තර කරන්න. (ලකුණු 06)

(iii) පැරණි ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ව්‍යුහයේ පැවති සාධනීය ලක්ෂණ තුනක් (03) පැහැදිලි කර විශේෂ අවශ්‍යතා අධ්‍යාපනයෙහි සංවර්ධනය සඳහා ඒවා භාවිත කළ හැකි ආකාරය විස්තර කරන්න. (ලකුණු 08)

13. (i) "පෘතුගීසි පාලන සමයට වඩා ලන්දේසි පාලන සමයේ දී ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය වඩාත් සංවිධිත විය." සාධක හතරක් (04) දක්වමින් සංසන්දනාත්මකව විශ්ලේෂණය කරන්න. (ලකුණු 08)

(ii) ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය පාලන සමයේදී කෝල්බෲක් කොමිසම විසින් අධ්‍යාපනය සම්බන්ධව ඉදිරිපත් කළ නිර්දේශ හතරක් (04) විස්තර කරන්න. (ලකුණු 04)

(iii) 1867 මෝර්ගන් කමිටුවේ නිර්දේශ නිසා ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය තුළ සිදුවූ යහපත් වර්ධනීය අවස්ථා හතරක් (04) සාකච්ඡා කරන්න. (ලකුණු 08)

14. (i) ශ්‍රී ලංකාවේ 1972 අධ්‍යාපන ප්‍රතිසංස්කරණය තුළ දක්නට ලැබුණු සුවිශේෂී ලක්ෂණ හතරක් (04) දක්වන්න. (ලකුණු 04)

(ii) (1948-1977) කාලය තුළ ශ්‍රී ලංකාවේ ගුරු අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ සිදු වූ වැදගත් සංවර්ධනයන් හතරක් (04) පැහැදිලි කරන්න. (ලකුණු 08)

(iii) විශේෂ අවශ්‍යතා සහිත සිසුන් සිය ඉගෙනුම් ක්‍රියාවලියේ දී මුහුණ දෙන ගැටලු හතරක් (04) දක්වා, එම ගැටලු විසඳීම සඳහා ශ්‍රී ලංකා රජය ගෙන ඇති පියවර හතරක් (04) විස්තර කරන්න. (ලකුණු 08)

හිමිකම් ඇවිරිණි.